ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No.    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2021 - 11 - 12

පැමිණිලිකාරිය : ආර්.එන්.ටී.ඒ රත්නායක මිය,
අඹතලාගම හන්දිය.
ඔරලෝසු කණුව අසල.
මිහින්තලය.

වගඋත්තරකරුවන් : ලේඛකාධිකාරී.
ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය.
මිහින්තලය.

<u>පැමිණිලි අංකය : **HRC/AP/665/2013**</u>

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ. ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයේ පුස්තකාල සහයක II ශ්‍රේණිය තනතුරු සඳහා අභ්‍යන්තරව බඳවා ගැනීම් සිදුකිරීමට විශ්ව විද්‍යාලය විසින් කටයුතු කළ බවත් ඒ අනුව පැමිණිලිකාරිය අදාළ තනතුර සඳහා අයදුම්පත්‍රයක් යොමුකර ලිඛිත පරීක්ෂණය සඳහාද පෙනී සිටින ලද බවත් අනතුරුව අදාළ තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයක්ද සිදුකළ මුත් එකී ලිඛිත පරීක්ෂණය හා සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමේදී බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් කරුණු නොසලකා හරිමින් අදාළ තනතුර සඳහා තමාට වඩා අඩු සුදුසුකම් සපුරා සිටි අය බඳවා ගන්නා ලද බවත්ය. එමඟින් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට පැමිණිල්ලෙන් දක්වා ඇත.

**වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-**

වගඋත්තර පාර්ශවය විසින් අංක RJT/LD/HRC/13/07 හා 2013.12.18 දිනැතිව වාර්තාවක් ඉදිරිපත් කරමින් දක්වා ඇත්තේ ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයේ පුස්තකාල සහයක II ශ්‍රේණියේ තනතුර සඳහා 2012.11.06 වන දින විශ්ව විද්‍යාලාන්තරව අයදුම්පත් කැඳවනු ලැබූ බවයි.

බඳවා ගැනීමේ පටිපාටියට අනුව අදාළ තනතුර සඳහා අභියෝගතා පරීක්ෂණයක්ද අනතුරුව සම්මුඛ පරීක්ෂණයක්ද. පැවැත්වූ බවත්. ඉහත පරීක්ෂණ දෙක සඳහාම පැමිණිලිකාරිය ඉදිරිපත් වූ

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

බවත්, අදාළ තනතුර සඳහා වූ සම්මුඛ පරීක්ෂණයට අයදුම්කරුවන් 07 දෙනකු පමණක් ඉදිරිපත් වූ බවත් අදාළ තෝරාගැනීමේදී අභියෝගතා පරීක්ෂණය සඳහා ලකුණු 75ක්ද ලබා දුන් බවත්, මේ අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් දෙදෙනකු අදාළ තනතුර සඳහා තෝරා ගන්නා ලද බවත් දක්වා ඇත.

ඒ අනුව පැමිණිලිකාරිය තම පැමිණිල්ල මගින් සිදුකරනු ලබන ප්‍රකාශ හා චෝදනා ප්‍රතික්ෂේප කරනු ලබන බවත් අදාළ පත්කිරීම් විනිවිදභාවයෙන් යුතුව සිදුකර ඇති බවත්, අදාළ පත්කිරීම මගින් පැමිණිලිකාරියට අසාධාරණයක් සිදුව නොමැති බවත් දන්වා ඇත.

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා විමර්ශනය :-**

II ශ්‍රේණියේ පුස්තකාල සහයක තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා රජරට විශ්ව විද්‍යාලයේ ස්ථිර සේවකයින්ගෙන් අයදුම්පත් කැඳවා ඇති අතර පැමිණිලිකාර ආර්.එන්.ඒ.ටී රත්නායක මහත්මිය අදාළ දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා ඇති හෙයින් අයදුම්පත් යොමුකර ඇත. අදාළ තනතුර සම්බන්ධයෙන් ලිඛිත පරීක්ෂණයක් පවත්වා අනතුරුව සම්මුඛ පරීක්ෂණයක්ද පවත්වා අයදුම්කරුවන් දෙදෙනකු අදාළ තනතුර සඳහා බඳවාගෙන ඇති අතර, පැමිණිලිකාරිය ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨ පුස්තකාලයේ කම්කරු III ශ්‍රේණියේ සේවය කරන අයකු වේ. විශ්ව විද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛ අංක 739 මගින් පුහුණු ශ්‍රේණියේ තනතුරුවලට අභ්‍යන්තර අපේක්ෂකයින් බඳවා ගැනීම පිළිබඳව කරුණු දක්වා ඇත.

මෙකී තනතුර සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් ලෙස දක්වා ඇත්තේ, අ.පො.ස (ස/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව/ඉංග්‍රීසි භාෂාව සහ ශුද්ධ ගණිතය ඇතුළු විෂයන් 06 කින් සමත්වීම හෝ අටවන ශ්‍රේණිය සමත්ව විශ්ව විද්‍යාල සෙවයේ වසර 10 ක පළපුරුද්ද සහ පුස්තකාල කටයුතු පිළිබඳව අවම වශයෙන් වසර දෙකකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම වේ. පැමිණිලිකාරිය ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇත.

පුස්තකාල සහයක II ශ්‍රේණියට බඳවාගෙන ඇති ඩී.එස්.ආර් දිසානායක හා ජී.ජී.එන්.සී විජේරත්න යන දෙදෙනා බඳවා ගැනීමේ නිවේදනය අනුව පුස්තකාල කටයුතු පිළිබඳව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්ද ලබා නොමැති අය වන බවද අනාවරණය වී ඇත.

මෙකී බඳවා ගැනීමට අදාළ සුදුසුකම් සම්බන්ධයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැහැදිලි කිරීමක් සිදුකර ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකාරිය තම පැමිණිල්ල මගින් මූලික වශයෙන් දක්වා ඇත්තේ ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයේ II ශ්‍රේණියේ පුස්තකාල සහයක පුරප්පාඩු පිරවීමේදී එම තනතුර ලබා ගැනීම සඳහා වන

සියළු සුදුසුකම් තමන් විසින් සපුරා සිටියදී තමන්ට එම තනතුර ලබා නොදී බඳවා ගැනීමේ **පරිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා නොමැති** අයදුම්කරුවන් දෙදෙනකු අදාළ තනතුර සඳහා බඳවා ගැනීමෙන් තම අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවයි.

මේ සම්බන්ධයෙන් වගඋත්තර පාර්ශවය කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, අදාළ තනතුර සඳහා තෝරාගත් දෙදෙනා විනිවිදභාවයෙන් යුක්තව අදාළ තනතුරට පත්කර ඇති බවත් පැමිණිලිකාරියගේ කිසිදු අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුව නොමැති බවත්ය.

ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරීගේ 2012.11.06 දිනැති නිවේදනය මඟින් පුස්තකාල සහයක II ශ්‍රේණිය සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර, අදාළ නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් යටතේ පැමිණිලිකාරිය අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06 ක් සමත්ව ඇති බැවින් හා (පැමිණිලිකාරිය 1995 වසරේ පැවැති අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් විෂයයන් පහයි, සම්මාන තුනක් ලබාගෙන ඇති අතර 1993 වසරේ පැවැති අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් විෂයයන් පහක් සමඟ සම්මාන 02 ක් ලබාගෙන ඇත) පුස්තකාල කටයුතු පිළිබඳව අවම වශයෙන් වසර 02 කට නොඅඩු පළපුරුද්ද ලබා තිබීම (පැමිණිලිකාරිය 2008 වසරේ සිට ව්‍යවහාරික විද්‍යා පීඨයේ පුස්ථකාලයේ III ශ්‍රේණියේ කම්කරුවෙකු ලෙස මේ දක්වා සේවය කරනු අයකු වේ. මේ බව වගඋත්තර පාර්ශවයද පිළිගෙන ඇත) හේතුවෙන් පැමිණිලිකාරිය අදාළ තනතුර සඳහා අයදුම්පත්‍රයක් යොමුකොට ඇත.

පැමිණිලිකාරිය ඇතුළු තවත් 6 දෙනකු මෙම තනතුර සඳහා අයදුම්පත් යොමුකර ඇති බවද දෙපාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත යොමුකර ඇති ලේඛන අනුව නිරීක්ෂණය වන අතර, මෙම තනතුර ලබා දීම සඳහා ලිඛිත පරීක්ෂණයක් පවත්වා අනතුරුව සම්මුඛ පරීක්ෂණයක්ද පවත්වා ඇති බව නිරීක්ෂණය වේ. පැමිණිලිකාරිය අදාළ පරීක්ෂණ අනුව සමස්ථ ලකුණු 57.0 ක් ලබාගෙන ඇති අතර පැමිණිලිකාරියට වඩා වැඩි ලකුණු ලබාගත් තවත් අයදුම්කරුවන් තිදෙනෙක් සිට ඇත. ඔවුන් පිළිවෙලින් ලකුණු 75.5, 71.25, හා 70.25 ලෙසට ලකුණු ලබා ඇත.

ඒ අනුව ලකුණු 75.5 ක් ලබාගෙන ඇති ඩී.එස්.ආර්. දිසානායක මහතා හා ලකුණු 71.25 ක් ලබාගෙන ඇති ඒ.ජී.එන්.සී විජේරත්න යන දෙදෙනා හට අදාළ තනතුර ලබා දී ඇත.

මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අදාළ නිවේදනයේ සඳහන් සුදුසුකම් අනුව ඉහත නම් සඳහන් අයදුම්කරුවන් දෙදෙනා නිවේදනයේ (I) (ආ) නිවේදනයේ සුදුසුකම් සපුරා ඇත. [(අ.පො.ස (සා/පෙළ) විභාගය සමත්වීම] නමුත් නිවේදනයේ (II) හි සඳහන් පුස්තකාල කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර දෙකක පළපුරුද්ද යන සුදුසුකම මෙම අයදුම්කරුවන් දෙදෙනා විසින් සපුරා නොමැති බව වගඋත්තරකරුවන් විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති සුදුසුකම් සහිත ලේඛනය අනුව නිරීක්ෂණය වේ.

නමුත් බඳවා ගැනීමට අදාළ නිවේදනයේ සඳහන් සියළු සුදුසුකම් පැමිණිලිකාරිය විසින් සපුරා ඇති බව පාර්ශවයන් විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ලේඛන අනුව නිරීක්ෂණය වේ. දෙපාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති සමස්ථ කරුණු සැළකිල්ලට ගැනීමේදී පුස්තකාල සහයක II තනතුරට බඳවා ගැනීමට අදාළ නිවේදනය අනුව, එම නිවේදනයේ සඳහන් මූලික සුදුසුකම් සපුරා නොතිබූ අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර පිළිගෙන ඔවුන්ට ලිඛිත හා සම්මුඛ පරීක්ෂණ වලට සහභාගී වීමට අවස්ථාව ලබා දීම තුළින්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම සුදුසුකම් සපුරා සිටි පැමිණිලිකාරිය සම්බන්ධයෙන් උල්ලංඝනය වන ආකාරයෙන් වගඋත්තරකරුවන් විසින් කටයුතු කර ඇති බවට නිරීක්ෂණය වේ.

එමෙන්ම අදාළ සම්මුඛ පරීක්ෂණයේදී පැමිණිලිකාරියගේ සුදුසුකම් නොසලකා හැර බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා නොතිබූ දෙදෙනකුට අදාළ තනතුර පිරිනැමීමෙන්ද වගඋත්තරකරුවන් විසින් ඉහත ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

එසේම මේ වන විටත් ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයේ II ශ්‍රේණියේ පුස්තකාල සහයක පුරප්පාඩු පවතින බවට දෙපාර්ශවය විසින්ම පිළිගෙන ඇත.

**නිර්දේශය :-**

ඒ අනුව පැමිණිලිකාරිය හට රජරට විශ්ව විද්‍යාලයේ II ශ්‍රේණියේ පුස්තකාල සහයක තනතුරට පත් කිරීමට කටයුතු කළ යුතු බවට වගඋත්තර පාර්ශවය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2021. 12. 31 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාරිය විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A Shanmuganathan 2021/11/10

අනුසුයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.**

ම.හේ.නිමල් කරුණාසිරි.
**කොමසාරිස්.**
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

B/

Ms. Anusuya **Shanmuganathan**
Commissioner
Human Rights Commissioner of Sri Lanka

Dr. M. H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka